
## 3.9 අට දිශාව සඳහා උපකරණයක් නිමවුම හා භාවිතය

(අ) පෙර දැනුම

i. අට දිශාව නම් කරන්න.
ii. අට දිශාව රූපයකින් දක්වන්න
iii. අට දිශාව මතකයට නගා ගැනීමට කවියක් ලියන්න

(ආ) උපකරණය සහ එහි උපාංග




(ඇ) උපකරණ නිමවුමට කාර්යය පත්‍රිකාව

i. වෘත්තාකාර තලයක අට දිශාව ලකුණු කරන්න. මෙය ඝන කාඩ්බෝඩ් එකක අලවා ගන්න.
ii. බෝනික්කාගේ දෙපා (iv) උපාංගයෙහි Aට හා Bට අමුණන්න.
iii. උපාංගයෙහි X හා Y හරහා හෙයා බුරුසු කෙදි මගින් කුඩා පියනෙහි අමුණන්න.
iv. පියනේ පතුලේ කේන්ද්‍රය හරහා (P හරහා) ප්‍රධාන වෘත්ත කොටසෙහි කේන්ද්‍රයට අමුණන්න. (මෙහි බෝනික්කා අවශ්‍ය විට සිටුවා තැබීමට හෝ හාන්සිකර තැබීමට)
v. භාවිතයට අදාළව ගැටළු සහිත පත්‍රිකාවක් ද මේ හා සම්බන්ධ කරන්න.

(ඈ) උපකරණ භාවිතයට කාර්යය පත්‍රිකාව

i. බෝනික්කා සිටුවා තබා ඔහුගේ මුහුණ අවශ්‍ය කරන දිශාවට යොමු කරවා දෑත් දෙපසට විහිදුවා තබන්න.
ii. (අ) ඔහුට පෙනෙන දිශාව (ආ) ඔහු පිටුපස හරවා සිටින දිශාව (ඇ) ඔහුගේ දකුණත දිගුව ඇති දිශාව (ඈ) ඔහුලේ වමත දිගුව ඇති දිශාව.............. යන ආදිය නිරීක්ෂණය කරන්න.
iii. ඒ ඒ ගැටළුවට අදාළ වන සේ බෝනික්කා ගේ මුහුණ දිශා ගත කරමින් ඒ ඒ අවස්ථාවලදී ලැබෙන දිශා විමසුම් කරන්න.
iv. උපකරණය රහිතව ගැටළු විසඳීමට මනෝමය හැකියාව (බුද්ධිය ) යොදවා බලන්න.

(ඉ) අමතර

i. විවිධ ගැටළු කිර්මාණය කරමින් ඒවායේ විසඳුම්
අ) උපකරණ මගින් ආ) මනෝමය වශයෙන් සොයා බලන්න.
ii. අට දිශාව මතක තබා ගැනීමට උචිත අර්ථවත් වගන්තියක් ඔබ ද නිර්මාණය කරන්න.